නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට නවිත්තාන්වෙලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 (ඇ), (ඈ) සහ (ඊ) නිරීක්ෂණයෙන් හැර, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන්, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ ප්‍රයෝජනය සඳහා මිලදී ගන්නා ලද සුළු භාණ්ඩ අයිතම් 16 ක වටිනාකම රු.99,930 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.	වසරකට වැඩි කාලයක් කල් පවතින භාණ්ඩවල වටිනාකම මේ යටතේ පෙන්නුම් කර ඇති බව.	සුළු භාණ්ඩ වටිනාකම ස්ථාවර වත්කම් වලින් ඉවත් කර සුදුසු පරිදි ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සභාවේ මහජන පුස්තකාලය සහ මහජන පොළ අළුත්වැඩියා කිරීමට සමාලෝචිත වර්ෂයේ වැය කරන ලද රු.749,220 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් ගොඩනැගිලි යටතේ දැක්වීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරි මූල්‍ය ප්‍රකාශයේ නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව.	වර්ෂයට අදාල වියදම් වර්ෂය තුලම සුදුසු වර්ගීකරණයන් යටතේ ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	සභාව සතු බැකෝ ලෝඩරය, ටොන් 10 රෝලරය, කුඩා රෝලරය, රෝලර් කැටපිලර් යන්ත්‍රය, ට්‍රැක්ටර්, ටේලර් සහ වතුර බවුසර් යන වාහනවල වටිනාකම තක්සේරු කර ගිණුම්වල දක්වා නොතිබුණි.	වාහනවල වටිනාකම තක්සේරු කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත. ඒ අනුව, ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන බව.	වටිනාකම තක්සේරු කර ගිණුම්වල දැක්විය යුතුය.
(ඈ)	2021 වර්ෂයේ රු.4,598,924 ක් වැය කර නිමකරන ලද වවලකඩේ පොදු ක්‍රිඩාංගනයේ තාප්පවල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.	ප්‍රමාද දෝෂයකින් දැක්වීමට නොහැකි විය. ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව.	අදාල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කළ යුතුය.

(ඉ) 2021 සහ 2022 වර්ෂවල සභාව වෙත ලැබුණු උපකරණ සහ පුස්තකාල පොත්වල වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේදි ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලබන බව.	අදාල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කළ යුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත			
	(i) 128 වගන්තිය	සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වත්කම් හඳුනාගෙන එහි අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	වත්කම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කරනු ලබන බව.	වත්කම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
	(ii) 134 වගන්තිය	ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සංවර්ධිත ප්‍රදේශ කාලයෙන් කාලයට හඳුනා ගැනීමට පියවර ගෙන නොතිබුණි.	සංවර්ධිත ප්‍රදේශවල නව ආදායම් ප්‍රභවයන් හඳුනා ගැනීමට කටයුතු කරමින් පවති.	සංවර්ධිත ප්‍රදේශ හඳුනාගෙන ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතිය			
	(i) 5(xii) රීතිය	මුදල් සහ ගබඩා භාණ්ඩ භාර නිලධාරීන් 03 දෙනෙකුගෙන් ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි	මේ වන විට ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කර ඇති බව.	මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
	(ii) 218 රීතිය	බලප්‍රදේශයේ සියලුම ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වාර්ෂිකව සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, එසේ සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.	සමීක්ෂණ සිදු කළද, අදාල ලියවිලි නොතිබුණු බැවින් විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති බව.	ඉඩම්, ගොඩනැගිලි සම්බන්ධ සමීක්ෂණයක් සිදුකර වාර්තාවක් විගණනයට

		ඉදිරිපත් කළ යුතුය.

2 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.2,084,935 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.6,940,497 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම රු.	බිල් කළ ආදායම රු.	රැස්කළ ආදායම රු.	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.	ඇස්තමේන්තුගත ආදායම රු.	බිල් කළ ආදායම රු.	රැස්කළ ආදායම රු.	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.
(i)	වරිපනම් හා බදු	-	-	-	-	-	-	-	-
(ii)	කුලී	5,230,000	5,302,000	4,146,725	1,155,275	4,475,000	3,363,347	3,607,437	1,058,675
(iii)	බලපත්‍ර ගාස්තු	1,015,000	1,038,100	1,038,100	-	790,000	874,900	874,900	-
(iv)	වෙනත් ආදායම්	3,317,500	1,888,634	1,871,066	17,568	3,017,500	1,451,179	1,469,018	19,640
		--------------	--------------	--------------	--------------	--------------	--------------	-------------	--------------
	එකතුව	9,562,500	8,228,734	7,055,891	1,172,843	8,282,500	5,689,426	5,951,355	1,078,315
		=========	=========	=========	=========	=========	=========	========	=========

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධන පිළිබඳ නිරීක්ෂයන් පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බදුකරුවන්ගෙන් අයවිය යුතු හිඟ කඩ කුලී රු.1,050,595 ක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.	2007 සිට 2022 දක්වා වූ හිඟ මුදලින් සමථ මණ්ඩල තීරණය අනුව ගෙවීම් කරමින් පවතින බව.	හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	කාර්යාල පරිශ්‍රයේ කඩ කාමර 05 ක් සහ වවලකඩේ කඩ	කඩ කාමර 02 ක් දැනට බදු දී ඇත. ඉතිරි කඩ කාමර බදු	කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතුය.

	කාමර 03 ක් බදු දීමට කටයුතු නොකිරීමෙන් වර්ෂ 05 ක සිට සභාව වෙත රු.2,400,000 ක බදු ආදායමක් අහිමිවී තිබුණි.	දීමට කටයුතු කර ඇති බව.	
(ඇ)	වෙළඳසැල් 525 කින් බලපත්‍ර ආදායමක් වශයෙන් රු.1,015,000 ක් අයකර ගැනීමට ඇස්තමේන්තු කළ ද, වෙළඳසැල් 338 කින් රු.902,100 ක් පමණක් අයකර ගෙන තිබුණි.	හිඟ මුදල දඩ මුදල සමඟ අයකර ගැනීමට කටයුතු කර ඇත. තවද, අක්‍රීය කඩ කාමර ලැයිස්තුවෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලබන බව.	යාවත්කාලීන කර වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2024 ජුලි සිට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල මුද්දර ගාස්තු ගණනය කර ප්‍රතිපූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2024 ජනවාරි සිට ජුලි දක්වා මුද්දර ගාස්තු ලැබී ඇත. ඉතිරි හිඟ මුදල ලබා ගැනීමට ගැනීමට කටයුතු කරනු ලබන බව.	මුද්දර ගාස්තු අදාල කාල පරිච්ඡේදයතුල ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විවරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

3.1 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
දිරන කසල යොදවා කාබනික පොහොර නිෂ්පාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදි, මෙම කාර්ය සිදු කිරීමට කටයුතු කරමි.	දිරන කසල යොදාගෙන කාබනික පොහොර නිෂ්පාදන කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ජල සම්බන්ධතාවය ලබා ගැනීමේදී ස්ථාන 527 ක් මාර්ගය පලුදු කිරීම සඳහා ගෙවන තැන්පතුව වූ රු.296,500 කින් අදාල ස්ථාන	මාර්ගයේ සකස් කිරීම් නිසි පරිදි සිදු කළද, තාක්ෂණ නිලධාරීගේ සහතික ලබා ගැනීමේ ක්‍රමයක් අනුගමනය කර නොතිබුණු	මාර්ග පලුදු කිරීම් නැවත සකස් කළ ස්ථාන තාක්ෂණ නිලධාරි විසින් සනාථ කළ යුතුය.

	සකස්කල බවට තාක්ෂණ නිලධාරිගෙන් සහතික ලබා ගෙන නොතිබුණි.	බව.	
(ආ)	ඉදි කිරීම් කර්මාන්ත සඳහා කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකු වෙත ගෙවන ලද රු.5,970,660 ක එකතු කර අගය මත බදු සම්බන්ධ විස්තර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	දැනට අදාල විස්තර විගණකාධිපති සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිපත් කිරීමට කටයුතු කර ඇති බව.	එකතු කළ අගය මත බදු සම්බන්ධ විස්තර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා දෙන ලද රජයේ ඉඩම මිනුම් කටයුතු කර දෙන ලෙස මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත 2023 පෙබරවාරි 22 දින රු.34,500 ක අත්තිකාරමක් ගෙවා තිබුණද, අදාල මිනුම් කටයුතු නිමකර ගැනිමට කටයුතු කර නොතිබුණි.	අදාල ඉඩම මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මිනුම් කටයුතු සිදු කළද, පිඹුරුපත් සකස්කර ලැබී ඇතත්, ඉඩමේ මායිම් සම්බන්ධයෙන් ගැටළුවක් මතුවී ඇති බැවින් ප්‍රාදේශීය ලේකම් විසින් පරීක්ෂණ කමිටුවක් පත් කර ඇති බව.	ඉඩමේ මායිම් සම්බන්ධ ගැටළු විසදාගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 වර්ෂයේ රු.671,000 ක් වැය කර මිලදී ගන්නා ලද කාබනික පොහොර නිෂ්පාදන යන්ත්‍රය අදාල අරමුණ සඳහා යොදවා ගෙන නොතිබුණි.	අදාල යන්ත්‍රය ක්‍රියාවිරහිතවී ඇති අතර, එය අළුත්වැඩියා කර ඉදිරියේදී කාබනික පොහොර නිෂ්පාදන කිරීමට කටයුතු කරනු ලබන බව.	යන්ත්‍රය අළුත්වැඩියා කර අදාල අරමුණ සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභා බලප්‍රදේශයේ අවසරපත්‍ර ලබා නොගත් ගොඩනැගිලි හඳුනාගෙන දඩ මුදල් අයකිරීම කටයුතු කර නොතිබුණි.	මෙම කාර්යය සඳහා සංවර්ධන නිලධාරීන් 02 දෙනෙක් යොදවා ඇති බව.	අනවසර ඉදිකිරීම සඳහා දඩ මුදල් අයකිරීමට කටයුතු කළ යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතු ඉඩම් සහ ගොඩනැගිලිවල වටිනාකම රු.223,640,056 ක් සමාලෝචිත වර්ෂයේ අවසන්	ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් නිසි පරිදි ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගෙන යනු ලබන	ඉඩම් සහ ගොඩනැගිලි යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය.

	ගිණුම්වල දක්වා තිබුණද, අදාල වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි.	අතර, ඉඩම්වල අයිතිය පිළිබඳ ගැටළු නිසා යාවත්කාලීන කර නොහැකිව ඇති බව.	
(ආ)	2024 වර්ෂයේ සභාවේ දෛනිකව එකතුවන ආදායමෙන් බැංකුවේ තැන්පත් නොකර රු.300 සිට රු.75,000 දක්වා මුදලක් අයකැමි භාරයේ තිබුණු අතර, මුදල් රෙගුලාසි 315 සහ 316 ප්‍රකාරව වානේ සේප්පුවක තැබීමට කටයුතු කර නොතිබුණි.	එක් එක් දිනවල පස්වරු 2 සිට ඊලග දින පස්වරු 2 දක්වා ලැබෙන සියළු ආදායම් බැංකු ගත කිරීම සාමාන්‍යයෙන් සිදුවේ. පස්වරු 2 පසු ලැබෙන ආදායම් බැංකු ගත කිරීමට නොහැකි බැවින්, අයකැමි වෙත තබා ගැනීමට සිදුවී ඇති අතර දැනට අදාල සේප්පුව අළුත්වැඩියා කිරීමට කටයුතු කර ඇති බව.	කඩිනමින් සේප්පුව අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන 08 ක් සභාවේ නමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.	සියළු වාහන සභාවේ නමට මාරු කිරීමට අවශ්‍ය අයදුම්පත් සම්පූර්ණ කර අදාල ස්ථානවලට යවා ඇති බව.	වාහන වල අයිතිය සභාව නමින් පවරා ගත යුතුය.
(ඈ)	2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 අංක දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සභාව සතු වාහනවල ඉන්ධන දහන පරීක්ෂා කළ යුතු වුවත්, සභාව සතු වාහන 07 ක එසේ සිදු කර නොතිබුණි.	ඉන්ධන දහන පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කර ඇති බව.	චක්‍රලේඛය අනුව කටයුතු කල යුතුය.
(ඉ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සභාව වෙත ලබා දී ඇති වතුර ටැංකි 11 ක් තොග ලේඛනයට ඇතුලත් කර නොතිබුණි.	තොග ලේඛනයට සටහන් කිරීමට කටයුතු කර ඇති බව.	අදාළ වතුර ටැංකි තොග ලේඛනයේ සටහන් කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	LDSP ව්‍යාපෘති යටතේ රු.2,795,000 ක මුදලකට මිලදී ගන්නා ලද වී කොටන යන්ත්‍රයේ එක් එක් යන්ත්‍ර කොටස් තොග ලේඛනයේ වෙන් වෙන් වශයෙන් දැක්වීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු සපයා නොමැත.	වී කොටන යන්ත්‍රයේ එක් එක් කොටස් වෙන් වෙන් වශයෙන් දැක්වීමට කටයුතු කළ යුතුය.

(උ)	2006 වර්ෂයේ සිට 2021 වර්ෂ දක්වා රු.9,275,865 ක් වැය කර මහජන පොළවල් 05 ක් ඉදිකර තිබුණද, ඒවා මහජනයාගේ ප්‍රයෝජනයකින් තොරව අත්හැර දමා තිබුණි.	මෙම පොළවල් ක්‍රියාත්මක කිරීමට සභාව විසින් කටයුතු කර ඇති බව.	මහජන පොල ජනතාවට වඩාත් සමීප හා වාසිදායක සේවාවක් සපයන ස්ථාන බවට පත් කර ආදායම් උපයාගත යුතුය.
(ඌ)	ස්වේච්ඡා සංවිධානයක් මගින් 2010 වර්ෂයේ සභාවට ලබා දී තිබූ, රු.3,000,000 ක් වටිනා ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය සක්‍යතා අධ්‍යනයක් නොකිරීම නිසා සුදුසු ස්ථානයක ඉදිකර නොතිබීම හේතුවෙන් අතහැර දමා තිබුණි.	මෙම ස්ථානය සඳහා විරුද්ධතාවයක් මතුවූ නිසා අත්හැරීමට සිදුවී ඇති බව.	ගැටළු විසදාගෙන අදාල අරමුණ සඳහා යොදවා ගැනීමට කටයුතු කළ යුතුය.

3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වවලකඩේ බහුකාර්ය ගොඩනැගිල්ල අදියර III හි ස්ථාන කීපයක ටයිල් ඇල්ලීමේදී ටයිල් ග්‍රවුට් නිසි ලෙස යොදවා නොතිබුණු අවස්ථා නිරීක්ෂණ විය.	අඩුපාඩු ක්ෂේත්‍ර පරීක්ෂණයේදී හඳුනාගත් අතර, නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	අඩුපාඩු සකස් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.
(ආ)	සභා බලප්‍රදේශයේ කොට්ඨාශ 07 ක් සහ ග්‍රාම නිලධාරි වසම් 20 ක් සඳහා එක් පුස්තකාලයක් පමණක් තිබෙන අතර, එම පුස්තකාලයද සුදුසු ස්ථානයක පිහිටුවා නොතිබුණි.	අදාල කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට කටයුතු කරනු ලබන බව.	මහජන පුස්තකාලය සියළු දෙනාට ප්‍රයෝජනයට ගතහැකි පරිදි ස්ථානගත කළ යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන සහ සංශෝධන කරන ලද 2023 නොවැම්බර් 30 දිනැති 02/2018(1) අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සභාව	දැනට මානව සම්පත් සැලැස්ම සකස් කර ඇති බව.	මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

විසින් 2024 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කර මානව සම්පත කාර්යක්ෂමව යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි.		
(ආ) සභාවේ කටයුතු සඳහා ලේකම්වරයෙක් පත්කර නොතිබුණි.	පිළිතුරු සපයා නොමැත.	කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය.

4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

4.1 තිරසාර සංවර්ධන ඉලක්ක

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනා ගෙන මිණුම් කිරීමට අවශ්‍ය දර්ශකය හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා ගත යුතුව ඇති බව.	2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත අනුව ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන අරමුණු සඳහා ළඟාවීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර ගත යුතුය.

4.2 පාරිසරික ගැටළු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ වෙළඳ ස්ථාන 20 ක් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමකින් තොරව පවත්වා ගෙන ගොස් ඇති බව නිරීක්ෂණ විය.	අදාල ආයතන වලට බලපත්‍ර අළුත් කරන ලෙස සිහි කැඳවීම් යවා ඇති අතර නීතියානුකූලව කටයුතු කරනු ලබන බව.	පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමට කටයුතු කළ යුතුය.

4.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභා බලප්‍රදේශයේ ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු ස්ථානයක් නොමැති බැවින්, මාසිකව ටොන් 129 ක් පමණ කසල ප්‍රමාණයක් අඬ්ඩාලවේනයි ප්‍රාදේශීය සභාවේ ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය වෙත බැහැර කිරීම සඳහා රු.44,397 ක මුදලක් වැය කර තිබුණි.	ඉදිරියේදී කාබනික පොහොර නිෂ්පාදන කිරීමට කටයුතු කරනු ලබන බව.	සභාව විසින් කසල කළමනාකරණ කටයුතු ආරම්භ කළ යුතුය.
(ආ)	කාබනික පොහොර නිෂ්පාදන සඳහා අවශ්‍ය මූලික කටයුතු කිසිවක් නොකර, සභාව සේවකයන් 23 දෙනෙකුට අදාල පුහුණු ලබා දී තිබුණි.	ඉදිරියෙදී කාබනික පොහොර නිෂ්පාදනයට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.	පුහුණු ශ්‍රමිකයින් යොදාගෙන කසල කළමනාකරණ කටයුතු ආරම්භ කළ යුතුය.